ශීර්ෂය - 317 උතුරු මැද පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

පිරිපුන් පළාතක්

1.2 මෙහෙවර

ධරණීය සමමිතික ඝන සාර්ව සංවර්ධන ප්‍රවේශයකින් පළාත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ජාතික සංවර්ධනයට ඍජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. මූල්‍ය ප්‍රකාශන

මුළු ප්‍රතිපාදන හා වියදම

2019 වර්ෂයේ දී උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 20,519.20 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රුපියල් මිලියන 18,570.07 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදයෙන් රුපියල් මිලියන 1,949.13 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2019.12.31 දිනට | | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| පුනරාවර්තන | 16,708.00 | 16,708.00 | - | |
| මූලධන | 3,811.20 | 1,862.07 | 1949.13 | 51 |
| එකතුව | 20,519.20 | 18,570.07 | 1,949.13 | 9.5 |

3. විගණන නිරීක්ෂණ

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.